කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.

Issued by Forecasting Division, National Meteorological Centre.

---

**2020 දෙසැම්බර් මස 03 දින සඳහා කාලගුණ අනාවැකිය**

**2020 දෙසැම්බර් මස 02 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "බුරවී" සුළි කුණාටුව අද (දෙසැම්බර් 02 ) පෙ.ව 08.30 වන විට ත්‍රිකුණාමලයට කි.මී. 200 ක් නැගෙනහිර ට බරව ගිනිකොණ දෙසින් උතුරු අක්ෂාංශ 8.6 ත් නැගෙනහිර දේශාංශ 83.0 ත් ආසන්නව ස්ථානගතව පැවතුනි.

මෙම පද්ධතිය බටහිරට නැඹුරුව වයඹ දෙසට ගමන් කර ත්‍රිකුණාමලය සහ පේදුරු තුඩුව අතරින් මුලතිව් වලට ආසන්නව ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළෙන් දිවයිනට අද (දෙසැම්බර් 02 ) රාත්‍රී කාලයේ(ප.ව 07.00-10.00 අතර ) දී ඇතුළු වේ යැයි බලාපොරොත්තු වේ.

සුළි කුණාටුව සමග සුළගේ වේගය පැ .කි.මී. 80-90 පමණ වන අතර විටින් විට පැ .කි.මී. 100 දක්වා වැඩි විය හැක. මෙය ක්‍රමයෙන් බටහිර දෙසට ගමන් කර මන්නාරම් බොක්ක වෙත හෙට(දෙසැම්බර් 03 ) උදෑසන වනවිට පැමිණෙණු ඇතැයි බලාපොරොත්තු වේ.

උතුරු සහ වයඹ පළාත්වල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.ඇතැම් ස්ථානවල මි.මී. 150 ට වැඩි ඉතා තද වැසිද ඇතිවිය හැක.

නැගෙනහිර, උතුරු මැද, බස්නාහිර, මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇතිවේ.

ඇතැම් ස්ථානවල මි.මී. 100 ක පමණ තද වැසිද ඇතිවිය හැක.

උතුරු, උතුරු මැද, ,වයඹ, බස්නාහිර, මධ්‍යම සහ සබරගමුව පළාත්වල විටින් විට පැ.කි.මි.(60 -70) පමණ දක්වා වන තද ප්‍රහාරාත්මක සුළං ඇතිවේ.

සෙසු ප්‍රදේශ වල විටින් විට පැ.කි.මි.(40 -50) පමණ දක්වා වන තද සුළං ඇති විය හැක.

ඇතිවිය හැකි අයහපත් කාලගුණික තත්වය පිළිබඳ විමසිලිමත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR 03rd DECEMBER 2020
## Issued at 12.00 noon on 02nd December 2020

The cyclonic storm ‘ **BUREVI’** over the south-west Bay of Bengal, lay centered near latitude 8.6°N and longitude 83.0°E, about 200 km east-southeast of Trincomalee at 0830 hrs today (02nd December).

**The system is very likely to move west-northwestwards and cross north-eastern coast of Sri Lanka between Trincomalee and Point-Pedro, close to Mullaithivu around tonight(within 7.00 p.m-10.00 p.m on 02 December )**

**This Cyclonic strom with a wind speed of 75-85 kmph gusting up to 95 kmph and it is very likely to move nearly westwards thereafter, emerge into Gulf of Mannar.**

**Intemittent showers/thundershowers will occur in the Northern and North-western provinces. Very heavy rainfall above 150mm can be expected at some places.**

**Showers or thundershowers at times will occur in the Eastern, North-central, Western, Central and sabaragamuwa provinces and in Galle and Matara districts. Heavy rainfall about 100mm can be expected at some places.**

**Strong gusty winds (60-70) kmph can be expected in Northern, North-Central, North-Western, Western, Central and Sabaragamuwa provinces.**
**Strong winds (40-50) kmph can be expected elsewhere.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**General public is requested to be vigilant regarding impending extreme weather situation.**

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2020 දෙසැම්බර් මස 02 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "බුරවී" සුළි කුණාටුව අද (දෙසැම්බර් 02 ) පෙ.ව 08.30 වන විට ත්‍රිකුණාමලයට කි.මී. 200 ක් නැගෙනහිර ට බරව ගිනිකොණ දෙසින් උතුරු අක්ෂාංශ 8.6 ත් නැගෙනහිර දේශාංශ 83.0 ත් ආසන්නව ස්ථානගතව පැවතුනි.**

**මෙම පද්ධතිය බටහිරට නැඹුරුව වයඹ දෙසට ගමන් කර ත්‍රිකුණාමලය සහ පේදුරු තුඩුව අතරින් මුලතිව් වලට ආසන්නව ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළෙන් දිවයිනට අද (දෙසැම්බර් 02 ) රාත්‍රී කාලයේ(ප.ව 07.00-10.00 අතර ) දී ඇතුළු වේ යැයි බලාපොරොත්තු වේ.**

**සුළි කුණාටුව සමග සුළගේ වේගය පැ .කි.මී. 80-90 පමණ වන අතර විටින් විට පැ .කි.මී. 100 දක්වා වැඩි විය හැක. මෙය ක්‍රමයෙන් බටහිර දෙසට ගමන් කර මන්නාරම් බොක්ක වෙත හෙට(දෙසැම්බර් 03 ) උදැසන වනවිට පැමිනෙණු ඇතැයි බලාපොරොත්තු වේ.**

**එබැවින් 05N-12N සහ 77E-90E අතර මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි, තද හෝ ඉතා තද ප්‍රහාරාත්මක සුළං සහ රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ ඇතිවිය හැක.**
**දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධිවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.**

**ධීවර හා නාවික ප්‍රජාව මේ පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

**පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට ඉතා තද වැසිද ඇතිවිය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි ඇති වේ.**

**සුළඟ:**

**ගාල්ල සිට මන්නාරම, ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දක්වා සිට වයඹ දක්වා දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (50-60) පමණ වේ. විටින් විට පැ.කි.මී. (80-95) දක්වා වැඩිවිය හැක.**

**සෙසු මුහුදු ප්‍රදේශවල සුළං ගිනිකොන සිට නිරිත දක්වා දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වේ. සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩිවිය හැක**

**මුහුදේ ස්වභාවය:**

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන ප්‍රදේශ විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැක. සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු විය හැක.**

**ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය දක්වා සහ පූනරින් සිට පුත්තලම දක්වා වන වෙරළබඩ ප්‍රදේශ වල මුහුදු රළ මීටර් (2.0-3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 02 December 2020**

The cyclonic storm ' **BUREVI'** over the south-west Bay of Bengal, lay centered near latitude 8.6°N and longitude 83.0°E, about 200 km east-southeast of Trincomalee at 0830 hrs today (02$^{nd}$ December)**.**

**The system is very likely to move west-northwestwards and cross north-eastern coast of Sri Lanka between Trincomalee and Point-Pedro, close to Mullaithivu around tonight(within 7.00 p.m-10.00 p.m on 02 December ).**

**This Cyclonic storm with a wind speed of 80-90 kmph gusting up to 100 kmph is very likely to move nearly westwards thereafter, emerge into Gulf of Mannar by tomorrow morning (December 03).**

**As such, intemittent showers/thundershowers, strong or very strong gusty winds and rough or very rough seas can be expected in the sea areas in between 05N-12N, 77E-90E during next few days.**

**Naval and fishing communities are advised not to venture into the deep ans shallow-sea areas over the island until further notice.**

**Fishing and naval community are requested to be attentive about future bulletins issued by the Department of Meteorology in next few days.**

**Condition of Rain:**

Intermittent showers or thundershowers will occur in the deep and shallow sea areas extending from Puttalam to Pottuvil via Mannar, Kankasanthurai, Trincomalee and Batticaloa.Very heavy showers can be expected some places in the above sea areas. Showers will occur at times elsewhere.

**Winds:**

Winds will be north-easterly to north-westerly in the sea areas extending from Galle to Batticaloa via Manna and Trincomalee, wind speed will be **(50-60) kmph** and wind speed can increase up to (80-95) kmph at times over these sea areas.

Winds will be south-easterly to south-westerly in the other sea areas around the island and the wind speed will be **(40-50) kmph** and can increase up to (**60-70) kmph** at times.

**State of Sea:**

The sea areas extending from Mannar to Pottuvil via Kankasanthurai and Trincomalee can be very rough or high at times. The other sea areas can berough or very rough at times.

There is a possibility that near shore sea areas off the coast extending from Trincomalee to Kankasanthurai and in Pooneryn to Puttalam may experience surges due to the effect of swell waves, having (2.0-3.0) m height.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි